(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 17.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 පෙබරවාරි 06 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු මුළු රජයේ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ ආරක්ෂක සේවා සපයනු ලබන ආරක්ෂක සමාගම්වල නම් කවරේද;

(iii) ඒ අතරින් රජයේ සමාගම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් රජයේ ආයතනවල ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවා සමාගම්වලට ගෙවන ලද මුදල එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ ආයතනවලට ආරක්ෂාව සැපයීමට අදාළ කොන්ත්‍රාත් ලබා ගැනීමේදී වංචනික ක්‍රියා සිදු වන බව දන්නේද;

(ii) එසේ නම්, රජයේ ආයතනවලට ආරක්ෂක සේවා සැපයීම, රජය සතු ආරක්ෂක සමාගම්වලට ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

60/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ නීතිවේදී උපාධිය ප්‍රදානය කරනු ලබන රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම විශ්වවිද්‍යාලවලින් නීතිවේදී උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිධාරීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වෙනත් විශ්වවිද්‍යාල කිහිපයකද නීති අධ්‍යයන අංශ ස්ථාපිත කර නීති අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

80/2024

ගරු රෝහණ බංඩාර මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති රට කවරේද;

(iii) එම එක් එක් කාර්යාලයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවයට ඇතුළත් වීම සඳහා සපුරාලිය යුතු අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම සුදුසුකම් සපුරාලීමෙන් තොරව, මේ වනවිට විදේශ රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, සේවා ස්ථානය සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සේවකයන් නැවත ශ්‍රී ලංකාවට කැඳවා නිසි සුදුසුකම් සහිත සේවකයන් විදේශ රටවල ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවල සේවයට යැවීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

88/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් හා වනඅලින් සංඛ්‍යාව එක් එක් වර්ෂය සහ වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අලි-මිනිස් ගැටුම සඳහා ස්ථිර විසඳුමක් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

102/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට නාඩු සහල් සහ සම්බා සහල් කිලෝ ග්‍රෑම් එකක වෙළඳපළ මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සහල් මිල අඩු කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iii) සහල් සඳහා පාලන මිලක් හඳුන්වා දෙන්නේද;

(iv) එසේ නම්, එම මිල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරිභෝගිකයන් වෙත හිඟයකින් තොරව සහල් ලබා දීම සඳහා රජයේ මැදිහත්වීම මත සහල් සංචිත පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එම සංචිත ප්‍රමාණය කොපමණද;

(iii) සහල් ආනයනය කිරීම සම්බන්ධයෙන් වන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

110/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය තුළ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්ත ශාලාවල නම් කවරේද;

(iii) එම කර්මාන්ත ශාලා වර්ගීකරණය කර ඇති ආකාරය කෙසේද;

(iv) එම එක් එක් කර්මාන්ත ශාලාව තුළින් උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) නව කර්මාන්ත ශාලා ආරම්භ කිරීමට ගිවිසුම් ගත වී ඇති ආයෝජකයන් සිටින්නේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

252/2024

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන කර්මාන්තයක් වන ඉස්සන් වගාව මේ වනවිට අර්බුදයකට ලක් වී ඇති බවත්;

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට එම කර්මාන්තය මඟින් විශාල ආර්ථිකමය ශක්තියක් ලැබුණ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) එම කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

297/2024

ගරු චාමර සම්පත් දසනායක මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) ඔහු සම්බන්ධයෙන් රජයේ විගණකාධිපතිවරයා විසින් විගණන පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iii) ජාසිංහ මහතා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් පත් කරනු ලබන අවස්ථාව වනවිට ඉහත සඳහන් විගණකාධිපතිවරයාගේ පරීක්ෂණය අවසන් වී තිබුණේද;

(iv) එම පරීක්ෂණයෙන් ජාසිංහ මහතා නිවැරදිකරුවකු බවට පත් වී තිබේද;

(v) ජාසිංහ මහතා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් කටයුතු කරන අවධියේදී රුපියල් ලක්ෂ 29ක් සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයකට ලක් වී ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

365/2024

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරක්ෂක අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද ඉස්ලාමීය ආගමික ග්‍රන්ථ හැර, අනෙකුත් ඉස්ලාමීය ආගමික ග්‍රන්ථ ආනයනය කිරීම සීමා කරමින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද නියෝගයක් යටතේ තහනමක් පනවනු ලැබූ බවත්;

(ii) මෙම තහනම මඟින් ආනයනය කරන ලද කුරානයේ පිටපත් නිකුත් කිරීම සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ පවා මාස කිහිපයක ප්‍රමාදයන් ඇති කර තිබෙන බවත්;

(iii) මෙම අගතිගාමී තහනම මඟින් ඇති කෙරෙන ආගමික ග්‍රන්ථ මුදා හැරීමේ දීර්ඝ කාලීන ප්‍රමාදයන් හේතුවෙන් ඉස්ලාමීය ග්‍රන්ථ ආනයනකරුවන්ට තදබල දුෂ්කරතා ඇති වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් සීමාවන් ඉවත් කිරීමට රජය කඩිනම් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(1)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2025 පෙබරවාරි 17 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(4)හි විධිවිධාන ප්‍රකාරව, 2025 පෙබරවාරි 18 අඟහරුවාදා, 19 බදාදා, 20 බ්‍රහස්පතින්දා, 21 සිකුරාදා, 22 සෙනසුරාදා, 24 සඳුදා සහ 25 අඟහරුවාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

3\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව 2025 පෙබරවාරි 18 අඟහරුවාදා සිට 20 බ්‍රහස්පතින්දා, 22 සෙනසුරාදා සහ 24 සඳුදා "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද සහ අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා වෙන් කළ 2025 පෙබරවාරි 21 සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද සහ අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, "විසර්ජන" පනත් කෙටුම්පත (2025) සලකා බැලීම සඳහා වෙන් කළ 2025 පෙබරවාරි 25 අඟහරුවාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ. භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

6\.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 ජනවාරි 22 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා,— බුද්ධිමය දේපළ පනත යටතේ නියෝග,— 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 160අ, 161ආ, 161ඇ, 161ඈ, 161ඉ, 161ඊ, 161උ, 161එ, 161ඔ සහ 161ඕ වගන්ති සමඟ කියවිය යුතු 204 වගන්තිය යටතේ එවකට වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා, සමූපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ඔක්තෝබර් 22 දිනැති අංක 2407/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***